**කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය - 2017**

**---------------------------------------------------------------**

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය පනතේ 15 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත 2018 මැයි 31 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**--------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටි, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිතබව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් රු.41,661,551 ක්වූ වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

අධිකාරිය විසින් ප්‍රතිලේඛන ණය යටතේ තේ ශක්ති අරමුදලට ලබා දී තිබූ වාහනයක, ණය නොගෙවීම හේතුවෙන් ණය මුදල අයකර ගැනීම සඳහා අධිකාරිය විසින් එම වාහනය විකුණා තිබුණු අතර ඉන් ලැබුණු රු.672,000 ක ලාභය තේ ශක්ති අරමුදලට ගෙවිය යුතු ලෙස දක්වා තිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

සමාලෝචිත වර්ෂය අවසාන දිනට ලැබිය යුතු ශේෂ 07 ක එකතු වටිනාකම රු. 89,112,762ක් වුවද ඊට අදාලව ඉදිරිපත් කරන ලද තහවුරු කිරීමේ ලිපි අනුව එම වටිනාකම රු. 89,849,404ක් වීමෙන් රු. 736,642 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂය අවසානයට වසර 5 ඉක්මවූ ලැබිය යුතු ගිණුම්වල වටිනාකම රු.21,071,890 ක් වූ අතර එම ශේෂය අයකිරීමට කටයුතු නොකර ගිණුම්වල අඛණ්ඩව පෙන්නුම් කර තිබුණි. එම ශේෂයෙන් එකතුව රු.17,016,838 ක ශේෂ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කෙරේ.

(අ) කුඩා තේ වතු සංවර්ධන සමිති සඳහා පොහොර, පොහොර ඉසින යන්ත්‍ර සහ තරාදි මිලදී ගැනීම සඳහා ලබා දී තිබූ මුදලින් රු.4,436,965 ක් අය විය යුතුව තිබූ අතර මෙය වර්ෂ 12 ඉක්මවා තිබුණි.

(ආ) 1998 වර්ෂයේ දී කුඩා තේ වතු සමිති සඳහා ණය පදනම මත වාහන ලබාදීම වෙනුවෙන් අධිකාරිය වෙත සමාලෝචිත වර්ෂය අවසානයට රු.6,663,284 ක් අයවිය යුතුව පැවති අතර එම ශේෂය අයකිරීමට කටයුතු කර නොතිබුණි. තවද එම වර්ෂයේදීම වර්ණ විභේදන යන්ත්‍ර ලබා ගැනීම සඳහා කම්හල් 4කට ලබාදී තිබූ මුදලින් රු.5,916,589 ක් අයවිය යුතුව තිබූ අතර විධිමත් ගිවිසුම් නොතිබීම හේතුවෙන් ණය අයකර ගැනීම ගැටළු සහගත වී තිබුණි.

## 3 මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.129,532,198 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,322,996 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.132,855,194 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ සංවර්ධන වියදම් රු.81,224,000 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2015 වර්ෂයේ දී පැවති ඌනතාවය 2016 වර්ෂයේදී අතිරික්තයක් බවට පත් වුවද සමාලෝචිත වර්ෂයේදී නැවතත් ඌනතාවයක් වී තිබුණි. කෙසේවුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය හා රජයට ගෙවූ බදු නැවත ගැලපීමේදී අධිකාරියේ දායකත්වය 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා හිතකර අගයක් ගෙන තිබූ අතර 2014 වර්ෂයේ රු.420,947,000 ක්වූ දායකත්වය 2017 වර්ෂයේදී රු.127,723,000 ක් දක්වා ක්‍රමිකව පිරිහී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව අධිකාරියෙහි ජංගම අනුපාතය 2017 හා 2016 වර්ෂවලදී පිළිවෙලින් 0.86:1 හා 1.65:1 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය පිරිහී තිබුණි.

### 3.3 අධිකාරියට එරෙහිව හෝ අධිකාරිය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

අධිකාරියේ සේවකයන් විසින් අධිකාරියට එරෙහිව නඩු 06 ක් ද අධිකාරිය විසින් සේවකයන්ට එරෙහිව නඩු 02ක් ද ගොනුකර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් එම නඩු කටයුතු අවසන් වී නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

අධිකාරිය ස්ථාපිත අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී හෙක්ටයාර් 1040 ක් වූ තේ නැවත වගා ඉලක්කයෙන් හෙක්ටයාර 748 ක් පමණක් ලඟා කරගෙන තිබුණි. 2015 වර්ෂයේ සිට තේ නැවත වගා සහනාධාර ලබා ගැනීමට අධිකාරිය නිකුත් කළ අවසර පත් ප්‍රමාණය වාර්ෂිකව වැඩි වී තිබුණද තේ

වගාකරුවන් විසින් බිම් සැකසීම හා පාංශු සංරක්ෂණයෙන් පසුව තේ නැවත වගාව සඳහා යොමු වීම පහලගොස් තිබුණි. සහනාධාරලාභීන් ඒ සඳහා යොමුකර වීමට අධිකාරිය ප්‍රමාණවත් ක්‍රියාමාර්ග නොගැනීම මේ සඳහා ප්‍රධාන ලෙස හේතුවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී භෝග පුනරුත්ථාපනය සඳහා සහනාධාර ලෙස රු.11,701,644 ක් කුඩා තේ වතු හිමියන්ට ගෙවා ඇති අතර පෙර වර්ෂයට සාපේක්ෂව එය සියයට 40 ක වැඩිවීමකි. එසේ වුවද එම සහනාධාර මුදලින් සමාලෝචිත වර්ෂය සඳහා පැල 912,500 ක් භෝග පුනරුත්ථාපනය සඳහා ඉලක්ක කළද, එයින් පුනරුත්ථාපනය කර ඇති පැල ප්‍රමාණය 564,145 ක් විය. ඒ අනුව කාර්යසාධනය සියයට 62 ක් පමණක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දී ගොවීන් වෙත ඩොලමයිට් මෙට්‍රික් ටොන් 1035ක් ලබාදීමට ඉලක්ක කළද මෙට්‍රික් ටොන් 25.3ක් පමණක් සපයා දී තිබුණු අතර එය ඉලක්කගත ප්‍රමාණයෙන් සියයට 2.4 ක් විය. මේ අනුව සාර්ථක වගාවක් සඳහා ඩොලමයිට් භාවිතය ඉතා වැදගත් වුවද ඩොලමයිට් භාවිතය පිළිබඳ කුඩා තේ වතු හිමියන්ගේ නැඹුරුතාවය වැඩි කිරීම සඳහා අධිකාරිය විසින් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(ඈ) ව්‍යාප්ති හා උපදේශන සේවා වැඩසටහන් සහ පාංශු කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.16,561,557 ක් වැය කර තිබුණු අතර පසුගිය වර්ෂයට සාපේක්ෂව එය රු.9,766,842කින් එනම් සියයට 143 ක වැඩි වීමකි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ ප්‍රගති වාර්තා අනුව පවත්වා තිබූ පුහුණු වැඩසටහන් ප්‍රමාණය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 4කින් පහළ ගොස් තිබුණි.

(ඉ) කුඩා තේ වතු හිමියන්ගේ තේ නිෂ්පාදන පිරිවැය අවම කිරීම සඳහා එම තේ වතු හිමියන් වෙත පොහොර සහනාධාර බෙදා හැරීම වෙනුවෙන් අධිකාරිය වෙත රු.914,568,156 ක් ලැබී තිබුණද සමාලෝචිත වර්ෂයේදී තේ ගොවීන් වෙත නිකුත් කළ මුදල රු.902,019,098 ක් විය. ඉතිරි මුදල වූ රු.12,549,058 ක් ලබාදීමකින් තොරව ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාලවල රඳවා ගෙන තිබුණි. පොහොර සඳහා මූල්‍ය සහනාධාර ලබා දීමේදී වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ගේ 2016 ජුනි 03 දිනැති අංක MPI/DEV.01/08/ FERTILIZER/01 දරන චක්‍රලේඛය ප්‍රකාරව අධිකාරිය විසින් කටයුතු කළයුතු වුවද ඊට පටහැනි වූ අවස්ථා පහත පරිදි වේ.

(i) චක්‍රලේඛයේ 2 ඡේදය ප්‍රකාරව පොහොර සහනාධාරය ලබා දීම සඳහා තිබිය යුතු අවම බිම් ප්‍රමාණය පර්චස් 20 ක් හා උපරිමය හෙක්ටයාර 01 ට අඩු විය යුතු වුවද ඊට පටහැනිව ගාල්ල ප්‍රාදේශීය කාර්යාලය මගින් රු.100,696 ක් ගෙවීම් කර තිබුණි.

(ii) චක්‍රලේඛයේ 7 වන ඡේදය ප්‍රකාරව සහනාධාර ලබා ගැනීම සඳහා ගොවීන් විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත්වල සඳහන් තොරතුරුවල නිරවද්‍යතාවය සනාථ කර ගැනීමෙන් පසු ගෙවීම් කළ යුතු වුවත් එසේ නොකිරීම හේතුවෙන් රු.21,183,489 ක්වූ ගෙවීම් සඳහා නිකුත් කරන ලද චෙක්පත් අහරු වී තිබුණි.

(iii) චක්‍රලේඛයේ 9 ඡේදය ප්‍රකාරව සහනධාර සඳහා සුදුසුකම් ලත් වගාකරුවන්ගේ විස්තර ඇතුලත් ලැයිස්තුවක් අධිකාරියේ වෙබ් අඩවියේ පළ කර නොතිබුණි.

(ඊ) කුඩා තේ වතු හිමියන් විසින් තේ පැල මිලදී ගැනීමේදී ගුණාත්මක තේ පැල මිලදී ගැනීමට හා වෙළඳපොල මිලගණන් පාලනය කිරීම සඳහා අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලබන ආයතනික තේ තවාන් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කෙරේ.

(i) තවාන් කළමනාකරණ උපදෙස් මාලාවේ අංක 4.2 ප්‍රකාරව තවාන්තුල තේ පැල මිය යාමේ ප්‍රතිශතය සියයට 10 ක අඩු මට්ටමක පවත්වා ගත යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසානයට හැඩිගල්ල, වලහන්දුව සහ මාවරල යන තවාන් 3 හි පැල මියයාමේ ප්‍රතිශතය පිළිවෙලින් සියයට 25.7, සියයට 31.4 හා සියයට 35.6 ක් විය.

(ii) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාප්ත) ගේ 2005 සැප්තැම්බර් 22 දිනැති අංක ව්‍යා/4/1 දරන උපදෙස් ලිපිය අනුව අධිකාරියේ තවාන්හි යොදන ලද පැලවලින් අවම අලෙවිය සියයට 85 ක්ව පැවතිය යුතු වුවද 2016/2017 වර්ෂය අවසානයේදී අධිකාරිය මඟින් පවත්වාගෙන යනු ලැබූ තවාන් 8 න් 5ක් එම අලෙවි ප්‍රතිශතය ලඟාකරගැනීමට අපොහොසත් වී තිබුණු අතර එම තවාන් වල අලෙවිය සියයට 48, සියයට 49, සියයට 64, සියයට 74 හා සියයට 77ක් විය.

(iii) සේවා සැපයීමේ පරමාර්ථයෙන් තවාන් පවත්වාගෙන යනු ලැබුවද අවම වශයෙන් නිෂ්පාදනය සඳහා දැරූ වියදම හෝ ආවරණය කර ගත යුතු බව තේ තවාන් කළමනාකරණ උපදෙස් මාලාවේ අවධාරණය කර තිබුණි. එසේ වුවද හැඩිගල්ල, වලහන්දුව හා මාවරල යන තේ තවාන් 03 හි ආදායම ඉක්මවා රු.1,045,513 ක වියදම් දරා තිබුණි.

(එ) තේ නිෂ්පාදනය හා ඵලදායීතාවය වැඩිකිරීම සඳහා කුඩා තේ වතු හිමියන්ට ගුණාත්මක පැල ලබාගැනීමේ අරමුණින් අධිකාරිය මගින් අධිකාරියේ ලියාපදිංචි බාහිර පාර්ශවයන්ගේ වාණිජ තේ තවාන් පවත්වාගෙනයාම හා අධීක්ෂණය කරනු ලබයි. වාණිජ තේ තවාන් සඳහා නිකුත් කළ අවසර පත්‍ර සංඛ්‍යාව 2015, 2016 හා 2017 වර්ෂයන්හි පිළිවෙලින් 701 ක්, 487 ක් හා 449 ක් ලෙස අඩු වෙමින් පැවතුණි. ඒ අනුව වාණිජ තේ තවාන් සඳහා අධිකාරියේ නිසි අධීක්ෂණය යොමු වී නොමැති බව නිරීක්ෂණය විය.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කුඩා තේ වතු හිමියන් වෙත වගා සහනාධාර නිකුත් කළ දින සිට වර්ෂ 03 ක කාලයක් තුල පැල සිටුවා අවසන් කළ යුතු අතර එසේ පැල සිටුවා අවසන් කිරීමට අපොහොසත් වූ අවස්ථා නිරීක්ෂණය විය. එහිදී වගා සහනාධාර ලෙස ගෙවා ඇති මුදල් ආපසු අයකර ගැනීමට අධිකාරිය විසින් කටයුතු කළයුතු වුවත් පළමු, දෙවන හා තුන්වන වාරික සඳහා මුදල් ලබා ගෙන වගාව අතර මගදී අත්හැර දමා තිබූ හෝ වගා වාර්තා එවා නොතිබූ කුඩා තේ වතු හිමියන් සම්බන්ධයෙන් කළමනාකරණය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ රු.8,494,376ක් වූ ස්ථාවර තැන්පතු පොලී ආදායම සඳහා ගෙවියයුතු බදු හඳුනාගෙන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත ප්‍රකාරව පාරිතෝෂික ගෙවීම දින 30 ක් තුලදී සිදුකල යුතු වුවද 2017 ජුලි 17 දින දී විශ්‍රාම ගිය නිලධාරියෙක් වෙනුවෙන් පාරිතෝෂික ගෙවීම ප්‍රමාදවීම නිසා ඒ වෙනුවෙන් අධිකාරිය විසින් රු.74,602 ක අධිභාරයක් ගෙවා තිබුණි.

(ඈ) අධිකාරියේ ගාල්ල ප්‍රාදේශීය කාර්යාලයට අයත් වලහන්දුව උපකාර්යාලය, පැලතවාන හා අක්මීමන මව් වගා ව්‍යාප්ති මධ්‍යස්ථානය පිහිටි ඉඩම්වල අයිතිය අධිකාරිය වෙත පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. තවද වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට අයත් යතුරු පැදි 2ක් අධිකාරිය විසින් භාවිතා කළද සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් එහි අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---

අළුත්වැඩියා කළයුතු තත්ත්වයේ පවතින අධිකාරිය සතු නිල නිවාස 04ක් වසර 05ක කාලයක සිට භාවිතයට ගැනීමෙන් තොරව නිෂ්කාර්යව පැවතුණු අතර මෙම නිවාස අළුත්වැඩියාකර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.4 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම් / දේපලවල ව්‍යාපෘති ආරම්භ කිරීම**

---

ප්‍රාදේශීය කාර්යාල 04 ක රු.23,280,986 ක් වටිනා ඉඩම්වල අයිතිය අධිකාරිය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම ඉඩම්වල රු.58,220,553 ක් වටිනා ගොඩනැගිලි ඉදිකර තිබුණි.

**4.5 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් ආයතනයේ සම්පත්**

---

අධිකාරියට අයත් වාහන 3ක් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත මුදාහැර තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී ඒ වෙනුවෙන් රු.250,150ක් වියදම් දරා තිබුණි.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

---

අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව 2017 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 459 ක් වූ අතර තථ්‍ය සංඛ්‍යාව 480 ක් විය. තවද තනතුරු 08 ක් දරන්නාට පමණක් පෞද්ගලික වනසේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කළමනාකරු(සංවර්ධන) හා කළමනාකරු(පුහුණු) තනතුරු 2014 වර්ෂයේ සිට ද තොරතුරු තාක්ෂණ නිලධාරී, තාක්ෂණ නිලධාරි යන තනතුරු මාස 6 ක පමණ කාලයක සිටද පුරප්පාඩුව පැවතුණි.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී අනියම්, වෙක්රෝල් හා කොන්ත්‍රාත් පදනම මත අධිකාරිය විසින් කළමනාකරණ සහකාර (MA 1-2), රියදුරු, කාර්යාල ආරක්ෂක සහායක යන තනතුරු සඳහා සේවකයන් 51 දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුළ වැටුප් ලෙස රු.7,900,689 ක් ගෙවා තිබුණි.

(ඇ) අධිකාරියේ වාර්ෂික වාර්තාව අනුව ඵලදායී ව්‍යාප්ති සේවාවක් සඳහා ව්‍යාප්ති නිලධාරියෙකුට වගාකරුවන් සංඛ්‍යාව 1:1000ක් විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ එම අගය 1:2751 ක් ව පැවතුණි. ඒ අනුව ව්‍යාප්ති නිලධාරියෙක් සඳහා වගාකරුවන් විශාල ප්‍රමාණයක් අධීක්ෂණය කිරීමට සිදුවීම ඵලදායී ව්‍යාප්ත සේවාවකට බාධාවක් වී තිබුණි.

(ඈ) කළමනාකරු (සංවර්ධන) තනතුර හා කළමනාකරු (මානව සම්පත්) තනතුර සඳහා වැඩබැලීම් පත්කිරීමේදී ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13:1:2 වගන්තිය හා 13:4 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඉ) 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය යටතේ නව ශ්‍රේණි ක්‍රමයකට අන්තර්ග්‍රහණය කිරීමේදී සහකාර ව්‍යාපෘති කළමනාකරු, කණිෂ්ඨ කළමනාකරණ සේවා ගණයේ JM(1-1) (11) එකොළොස් වන වැටුප් පියවරේ පිහිටුවිය යුතු අතර උපයාගෙන ඇති වැටුප් වර්ධක ලබාදිය යුත්තේ උසස්වීම් නොලැබූ තීරය යටතේ වැටුප් පියවරයන් භාවිතා කරමින් බව දක්වා තිබුණද, මෙම නිලධාරියා වෙත වැටුප් ගෙවීමේ දී ඒ අනුව කටයුතු නොකිරීම නිසා වැඩිපුර වැටුප් ලබා දී තිබුණි.

## 5. තිරසර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තිරසර ඉලක්ක කරා ළඟා වීම සඳහා ආයතනය විසින් හදුනාගත් කාර්යයන් වාර්ෂික සැලැස්මට ඇතුළත් කර නොතිබූ අතර එම කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂිකව අයවැයට ඇතුළත් කර නොතිබුණි.

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට සූදානම්වීමේදී අනෙකුත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් නොකිරීම හේතුවෙන් ඉලක්ක ගත අරමුණු කරා ළඟාවීමට සැලසුම් සකස් කිරීමේ හා පෙර සූදානම්වීමේ ක්‍රියාවලිය ඉතා මන්දගාමී තත්ත්වයක පැවති බව නිරීක්ෂණය විය.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 6.5.1 ඡේදය පරිදි මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කරන ලද්දේ 2018 මාර්තු 23 දිනදීය.

### 6.2 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

#### 6.2.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 ජනවාරි 25 දිනැති අංක 8 දරන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ආ) මාර්ගෝපදේශය අනුව අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තු ගත කර තිබිය යුතු වුවද එසේ කිරීමට කටයුතු කර නොතිබුණි. තවද 4.2.1 (ඉ) මාර්ගෝපදේශය අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස හයකට වැඩි නොවන කාලයක් තුලදී නිතිපතා යාවත්කාලීන කළයුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්මට සමාලෝචිත වර්ෂයේදී ඉටු කරන ලද එකතුව රු.5,948,591 ක් වටිනා කොන්ත්‍රාත් 6ක් හා රු.590,700 ක් වටිනා ලීබඩු හා උපකරණ මිලදී ගැනීම් ඇතුලත් කර නොතිබූ අතර ප්‍රසම්පාදන සැලැස්මෙහි දක්වා තිබූ රු.මිලියන 14.8 ක් වටිනා ඉදිකිරීම් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) ප්‍රසම්පාදන අත්පොතෙහි 2.14.1 වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණ අනුව කොන්ත්‍රාත්තුව පිරිනමනු ලැබීමට පෙර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙතින් අනුමැතිය ලබා ගත යුතු වුවත් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වර්ෂ 5ක් වෙනුවෙන් රු.12,000,000ක වාහනයක් මිලදී ගැනීමේ දී එසේ සිදු කර නොතිබුණි.

(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1 මාර්ගෝපදේශය ප්‍රකාරව 2.14.1 වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදනය කිරීමට ඇති භාණ්ඩ සඳහා අදාළ ප්‍රසම්පාදන අරමුණු ඉටුකර ගැනීමේ අරමුණින් පිරිවිතර සැකසිය යුතු වුවත් රු.609,348 ක්වූ කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා ලංසු කැඳවීමෙන් පසුව පිරිවිතර සකස් කර තිබුණි.

(ඉ) 2017 වර්ෂයේදී නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවීන් වෙත බෙදා හැරීම සඳහා රු.100,390,089 ක කෘෂි උපකරණ මිලදී ගැනීමට අදාලව පහත නිරීක්ෂණ කෙරේ.

(i) කෘෂි උපකරණ මිලදී ගැනීම සම්බන්ධයෙන් පත්කර තිබුණු අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතේ 2.7.4 මාර්ගෝපදේශය අනුව අදාල විෂය සම්බන්ධ දැනුමක් ඇති පුද්ගලයෙකු පත්කර නොතිබුණි. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 මාර්ගෝපදේශය අනුව තාක්ෂණික ඇගයීම් කමිටුවක අදාල විෂය පිළිබඳ විශේෂඥයෙකු හා ප්‍රසම්පාදන කාර්යය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ඇති එක් සාමාජිකයකු හෝ සිටිය යුතු අතර එසේ නොමැති අවස්ථාවන් හිදී තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් බාහිර සාමාජිකයෙකුගේ හෝ ආයතන වලින් විශේෂඥ උපදෙස් ලබා ගත යුතු වුවත් අධිකාරිය යොමු ගත මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 මාර්ගෝපදේශය ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණ, භාණ්ඩ සඳහා ඇනවුම් ලබාදීමට පූර්වයෙන් ලබාගැනීමට කටයුතු කළයුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(iii) මිලදිගෙන තිබූ ලීටර 5000 වතුර ටැංකි 20 ම බෙදාහැරීමෙන් තොරව 2018 මාර්තු 13 දින වන විටත් ප්‍රාදේශිය කාර්යාලයට අයත් මධ්‍යස්ථානයන්හි ගබඩා කර තිබුණි.

(iv) අධිකාරියේ සංඛ්‍යා දත්ත අනුව 2017 වර්ෂය වන විට නුවරඑළිය දිස්ත්‍රික්කයේ කුඩා තේ වතු හිමියන් සංඛ්‍යාව 16,875 ක් වන නමුත් මිලදී ගෙනතිබූ භාණ්ඩ ඒකක සංඛ්‍යාව 38,970 ක් වන අතර සමාලෝචිත වර්ෂය අවසන් දින වනවිට නොබෙදා ඉතිරිව ගබඩාවෙහි පවතින ඒකක සංඛ්‍යාව 13,467 ක් විය. ඒ අනුව අවශ්‍යතාව හඳුනාගෙන මිලදීගතයුතු ඒකක ප්‍රමාණය තීරණය කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඊ) 2016 මාර්තු 17 දිනැති අංක 01/2016 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ මෝටර් රථ ලබාගත හැක්කේ අළුත්ම වාහන හෝ කුලියට ලබාදෙන අවස්ථාවේදී ධාවන දුර ප්‍රමාණය කිලෝමීටර් 1000 අඩු ලියාපදිංචි නොකරන ලද එකක් වියයුතු වුවද , අධිකාරිය විසින් මෙම ක්‍රමය යටතේ මාසයකට රු.200,000 බැගින් මාස 60 ක් සඳහා ලබා ගන්නා ලද මෝටර් රථය පුද්ගලයෙකුගේ නමින් ලියාපදිංචි කර තිබූ වාහනයක් විය.

(උ) සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන කාර්යාලය සහ හන්තාන පුහුණු මධ්‍යස්ථානය සඳහා දිවා රාත්‍රී ආරක්ෂක සේවාව සැපයීම සඳහා ද සියළු ප්‍රාදේශීය කාර්යාලයන්හි රාත්‍රී ආරක්ෂක සේවාව සැපයීම සඳහා ද රු.4,458,663කට පුද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම් ගත වී ඒ වෙනුවෙන් රු.5,011,149 ක් ගෙවා තිබුණි. එසේ වුවද මාතර ප්‍රාදේශීය කාර්යාලයේ රු.329,819ක් වෙනත් පුද්ගලික ආරක්ෂක ආයතනයකටද, කළුතර හා ඌව ප්‍රාදේශීය කාර්යාලයන්හි ආරක්ෂක සේවාව සැපයීම වෙනුවෙන් රු.796,874ක් අධිකාරියේ සේවකයන්ටද ගෙවීම් කර තිබුණි.

### 6.2.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

ඉකුත් වර්ෂයේ රු.4,366,397 ක වියදම් දරා ප්‍රධාන කාර්යාල භූමියේ උද්‍යාන අලංකරණය කිරීම් සිදුකර තිබූ අතර ගල් ඇතිරීමේදී පස් ස්ථරය ප්‍රමාණවත් ලෙස මට්ටම් කර නිසි ප්‍රමිතියට සකස් කර නොතිබීම හේතුවෙන් ගල් පහත්වීමක් සිදුවී තිබුණි. කෙසේ වුවද අදාල බිම් කොටසේ නැවත ගල් ඇතිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රඳවා ගත් මුදලින් එම මුදල ආවරණය කර ගැනීමට කටයුතු නොකර රු.164,500 ක් මුල් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

### 6.3 අයවැය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අයවැයගත හා තථ්‍ය ආදායම් අතර සියයට 67 සිට සියයට 86 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) අධිකාරියේ අයවැය අනුව භෝග පුනරුත්ථාපන සහනාධාර සඳහා වෙන්කර තිබූ රු. මිලියන 18.04 ක මුදලින් රු. මිලියන 0.75 ක් ලබා ගැනීමට යෝජනාකර අනුමැතිය ලැබී තිබුණද එය සංශෝධිත අයවැය තුල ඇතුළත් වී නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | කාර්ය මණ්ඩල පරිපාලනය | තනතුරුවල පුරප්පාඩු පැවතීම, විධිමත් අනුමැතිය සහිතව බඳවා ගැනීම් සිදු නොකිරීම. |
| (ආ) | සහනාධාර ගෙවීම් | සහනාධාර ලබා දීමෙන් අනතුරුව පසු විපරම් කටයුතු සිදු නොකිරීම. |
| (ඇ) | වත්කම් පාලනය | විධිමත් ලෙස වත්කම් පවරා නොගැනීම හා වත්කම්වල ඵලදායී ජීවකාලය සමාලෝචනය නොකිරීම. |